# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.01. 27

**චක්‍රලේඛ - බැ/නි/ඡ/2021/02**

සියලුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ

සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් ක්‍රියාත්මක කළ යුතු යහපත් වූ පාලනයන් සහ විශිෂ්ඨ ව්‍යාපාරික පරිචයන්**

**Good Governance and Best Practices for Financial Co-op Rural Banks and Societies/ Federations**

### 01. හැඳින්වීම

මෙම චක්‍රලේඛයේ අරමුණ වනුයේ සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් කාර්යක්ෂමතාව, සඵලත්වය සහ තිරසාරත්වය සඳහාත් සාමාජික ප්‍රජාවගේ සහ තැන්පත්කරුවන්ගේ විශ්වාසනීයත්වය තහවුරු කරමින් සිය තැන්පතු ආපසු ලබා ගැනීම් හැකියාවේ සුරක්ෂිතතාව සඳහාත් පැවතිය යුතු යහපත්වූ පාලන පරිචයන් සහ විශේෂයෙන් ව්‍යාපාරික පරිචයන් හඳුන්වා දෙමින් ක්‍රියාත්මක කරලීම සඳහා උපදෙස් සම්පාදනය වේ.

### 02. යහපත් වූ පාලනය යනු කුමක් ද? (What is Good Governance ?)

සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල තිරසාරත්වය තහවුරු කෙරෙන කළමනාකරණ රාමුව Management Framework හෙවත් කාර්ය සැලැස්ම සහ පටිපාටිය "යහපත් පාලනය" යන්නෙන් සැළකිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ සහ විශේෂිත බැංකු වලට සහ මූල්‍ය සමාගම් වෙත නිකුත් කරන ලද "යහපත් වූ පාලන" මූලධර්ම සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ උපදෙස් සහ මඟපෙන්වීම් මෙම චක්‍රලේඛය සැකසීමේ දී සැළකිල්ලට ගනු ලැබීය.

## 03. යහපත් වූ පාලන මූලධර්ම

ප්‍රධාන මූලධර්ම 10ක් යටතේ මෙම චක්‍රලේඛය සකස් කර ඇත.

I. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
II. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය
III. අධ්‍යක්ෂවරුන්ගේ යථායෝග්‍යතාව (Fit and Proper)
IV. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමධ්‍යගත කර ඇති කළමනාකරණ ශ්‍රිතයන්
V. සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී
VI. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු
VII. සම්බන්ධිත පාර්ශවීය ගණුදෙනු (Related party Transactions) සහ බැඳියා පිළිගැටුම් තත්ත්වයන් (Conflict of interest)
VIII. තොරතුරු හෙළි කිරීමේ මූලධර්මයන් (Principles of Disclosure)
IX. ආයතනයේ විනය නීති සංග්‍රහය (Disciplinary Procedure)
X. ආයතනයේ සමස්ත සේවක පිරිසගේ ආචාර ධර්ම පද්ධතිය (Code of Conduct)

### 3.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් මතු සඳහන් උපදෙස් ක්‍රියාත්මක කරමින් සමුපකාර මූල්‍ය සේවා සමිතියේ ශක්තිමත්භාවය සහ සුරක්ෂිත බව (Sound and Safer) තහවුරු කෙරෙන අයුරු කටයුතු කළ යුතු ය.

I. සමිතියේ උපක්‍රමික අරමුණු සහ සමුපකාරිය වටිනාකම් අනුමත කරමින් සමස්ත සමිතිය තුළ සන්නිවේදනය කිරීම.
II. සමිතියේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපායන්, එනම් අවදානම් ප්‍රතිපත්තීන්, අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටීන් සහ යන්ත්‍රණය ඉදිරි තෙවසර සඳහා සකස් කර අනුමත කිරීම.
III. ප්‍රධාන අවදානම් මූලාශ්‍රයන් හඳුනාගෙන විචක්ෂණශීලීව එම අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.
IV. සියලුම ලැදියාවක් දක්වන පාර්ශවයන්ට (Stakeholders) එනම් සාමාජිකයන්, තැන්පත්කරුවන්, ණයකරුවන් සහ නියාමනකරුවන් යන පාර්ශවයන් සඳහා සන්නිවේදන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.
V. සමිතියේ අභ්‍යන්තර පාලන (Internal Control) ක්‍රමවේදයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ (Management Information System) ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය විමර්ශණය කිරීම.
VI. සමිතියේ ප්‍රතිපත්තීන්ට වැදගත් ලෙස බලපෑම් කළ හැකි ප්‍රධාන කළමනාකරණ තනතුරු සම්බන්ධව කාර්ය කටයුතු, ව්‍යාපාරික කටයුතු පිළිබඳව පාලනයන්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳව හඳුනා ගැනීම.
VII. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු වල බලතල සහ වගකීම් නිර්වචනය කිරීම.

VIII. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති වලට අනුව ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන්නවුන් ක්‍රියාකරන බව තහවුරු කර ගැනීම.

IX. කාලීනව අධ්‍යක්ෂවරුන්ගේ තෝරා ගැනීම, නාමනය, ඡන්දයෙන් පත් කිරීම පිළිබඳ සඵලදායිත්වය ඇගයීම, බැඳීම් පිළිගැටුම් තත්ත්වයන් සහ දුර්වලතා හඳුනා ගෙන අවශ්‍ය වෙනස් කිරීම් සහ ගැළපීම් සිදු කිරීම.

X. නියාමන පරිසරය අවබෝධ කර ගෙන නියාමනකරු සමඟ සඵලදායී සබඳතාවක් පවත්නේ ද යන්න තහවුරු කර ගැනීම.

**3.2 අනුකමිටු**

පහත සඳහන් අනුකමිටු ක්‍රියාත්මක වීම අනිවාර්ය වේ.

I. විගණන කමිටුව (Board Audit Committee - BAC)
II. මානව සම්පත් කළමනාකරණ කමිටුව (Board Human Recourses Management Committee - BHRMC)
III. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (Board Integrated Risk Management Committee - BIRMC)
IV. ආයෝජන සහ අවදානම් කළමනාකරණ කමිටුව - Investment and Risk Management Committee)

**i. විගණන කමිටුව**

- මෙහි සංයුතිය අනුව ගණකාධිකරණය, අර්ථ ශාස්ත්‍රය, වාණිජ්‍ය වැනි විෂයන් පිළිබඳව මනා දැනුමක් ඇති පුද්ගලයන් සාමාජිකයන් විය යුතු ය.
- මාසිකව ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය), F-28 වාර්තාව නිවැරදිව පිළියෙල කිරීමෙන්, යාවත්කාලීන කිරීමෙන් සහ විශ්ලේෂණය කිරීමෙන් අවශ්‍ය මඟපෙන්වීම් කළ යුතු ය. තවද සියලුම කාර්තු අවසාන මූල්‍ය වාර්තා සහ මුදල් වර්ෂ අවසාන මුදල් වාර්තා පරීක්ෂා කර, කළමනාකාරීත්වයට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් කළ යුතු ය.
- බාහිර විගණක වාර්තා අධ්‍යනය කර අවශ්‍ය නිවැරදි කිරීම් පසු විපරම් කළ යුතු ය.
- අභ්‍යන්තර විගණකගේ කාර්යභාරයේ ප්‍රමාණාත්මක බව අධ්‍යනය කළ යුතු ය, අවශ්‍ය නිවැරදි කිරීම් ක්ෂණිකව කළ යුතු ය.
- සමිතිය පිළිබඳව ලැබෙන බාහිර පැමිණිලි, වාර්තා වන වංචා, අක්‍රමිකතා, දූෂ්කෘත නිවේදනයන් (Whistle Blow) පිළිබඳව ගනු ලැබූ පියවරයන් මැනවින් අධ්‍යනය කර ඒවා තුළින් සිදු වීමට ඉඩ ඇති අලාභ හානි සහ අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ගනු ලබන පියවරයන් පසු විපරම් කිරීම.

- කමිටු සාමාජිකත්වය පහත පරිදි විය යුතු ය.
    1. සභාපති හෝ උපසභාපති
    2. අධ්‍යක්ෂවරයෙකු
    3. සාමාන්‍යාධිකාරී
    4. ගණකාධිකාරී
    5. ප්‍රධාන අභ්‍යන්තර විගණක

ii. **මානව සම්පත් කළමනාකරණ කමිටුව (Board Human Resources Management Committee)**

- මානව සම්පත් කළමනාකරණය සැලසුම් කිරීමේ කටයුතු.
- සේවකයන් බඳවා ගැනීම, තනතුරු සඳහා පත් කිරීම, සේවකයන් ස්ථිර කිරීම, උසස් කිරීම්, සේවකයන්ගේ කාර්ය සාධන ඇගයීම, විනය කටයුතු සහ වෙනත් ශ්‍රමිකයන් සම්බන්ධිත කටයුතු තීරණය කිරීම.
- මානව සම්පත් පුහුණු සහ සංවර්ධන කටයුතු.
- අනුප්‍රාප්තික සැලසුම් (Succession Plans) සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- සේවක කාර්ය සාධන ඇගයීමේ (Performance Appraisal) ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- සේවක විනය කාර්ය පටිපාටිය සම්බන්ධ කටයුතු.
- සේවක දුක්ගැනවිලි කටයුතු. (Grievances)
- කමිටු සාමාජිකත්වය පහත පරිදි විය යුතු ය.
    1. සභාපති හෝ උපසභාපති
    2. අධ්‍යක්ෂවරයෙකු
    3. සාමාන්‍යාධිකාරී
    4. ගණකාධිකාරී
    5. මානව සම්පත් කළමනාකරු/ පිරිස් කළමනාකරු

iii. **ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (Integrated Risk Management Committee)**

- බැංකු සහ මූල්‍ය සේවා කටයුතු වලදී අවදානම අනිවාර්ය සාධකයක් බව පැහැදිලිය. බැංකු සහ මූල්‍ය කටයුතු වලදී ණය, මෙහෙයුම්, ද්‍රවශීලතා, වෙළෙඳපළ, නෛතික, අනුකූලතා, සංකේන්ද්‍රණ සහ ප්‍රතිරූපීය අවදානම් වලට නිරන්තරයෙන්ම මුහුණ දීමට සිදු වේ.
- මෙම අවදානම් සඳහා ඍජුව සහ වක්‍රව වගකිව යුතු අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, බැංකු සේවා ප්‍රධානී, ග්‍රාමීය බැංකු කළමනාකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක ආදී ප්‍රධාන පාර්ශවයන් නිරන්තරයෙන් මෙම අවදානම් ඇති වීමට

ඇති සම්භාවිතාවන් ඇති බැවින් කමිටුව විචක්ෂණශීලීව අධ්‍යනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු ය.

- එම වාර්තාවන් මැනවින් අධ්‍යනය කර, අවශ්‍ය තීරණයන් ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර අඛණ්ඩව ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය.
- ව්‍යාපාරික පරිසරය තුළ දේශීයව සහ ජාත්‍යන්තරව ඇති වන දේශපාලනික, සාමාජීය, ආර්ථික, තාක්ෂණික, නෛතික සහ පාරිසරික වෙනස්වීම් තුළින් සමිතියේ මූල්‍ය සේවා අංශයට අනාගතයේ දී මුහුණ දීමට සිදු වේ යැයි උපකල්පනය කරන අවදානම් ප්‍රෝත්සාහීව (Proactive) හඳුනා ගෙන ක්‍රියාමාර්ගයන් පිළිබඳව ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කර එම යෝජනා සහ අදහස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය.
- මූල්‍ය සේවාවන්ට සෘජුව අදාල වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික මූල්‍ය ප්‍රතිපත්ති තීරණ (Monetary Board Decisions on Monetary Policy), රජයේ වාර්ෂික සැලැස්ම වන රාජ්‍ය අයවැය ලේඛණයේ යෝජනා, රාජ්‍ය බදු ප්‍රතිපත්තීන් වෙනස්වීම් රජයේ ආර්ථික සැලසුම් පිළිබඳ ක්‍රමෝපායන්, ස්වාභාවික පරිසරයේ ඇති වන සෘජුව පාලනය කළ නොහැකි සිද්ධීන් ආදිය පිළිබඳව වැදගත් වන තොරතුරු මෙම කමිටුව විසින් ගැඹුරින් අධ්‍යනය කර, ඒවායින් සමිතියේ බැංකු සහ මූල්‍ය අංශයට වන අහිතකර බලපෑම් වළක්වා ගැනීමටත්, හිතකර බලපෑම් වලින් සමිතියට උපරිම ඵල නෙළා ගැනීමටත් අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ කර ක්‍රියාත්මක කළ යුතු ය.
- කමිටු සාමාජිකත්වය පහත පරිදි විය යුතු ය.
    i. සභාපති හෝ උපසභාපති
    ii. අධ්‍යක්ෂවරයෙකු
    iii. සාමාන්‍යාධිකාරී
    iv. ගණකාධිකාරී
    v. බැංකු සේවා කළමනාකරු
    vi. ව්‍යාපාර සංවර්ධන නිලධාරී
    vii. ප්‍රධාන අභ්‍යන්තර විගණක

**iv. ආයෝජන සහ අවදානම් කළමනාකරණ කමිටුව - (Investment and Risk Management Committee)**

- මූල්‍ය සේවාවන් සපයන සමුපකාර සමිතියක මෙම කමිටුවේ කාර්යභාර්ය අතිශයින් වැදගත්ය. ශේෂ පත්‍රයෙන් නිරූපණය වන සියළුම වත්කම් සහ වගකීම්, ප්‍රාග්ධනය ආයතනයේ අරමුණු ඉටු වන ආකාරයට කළමනාකරණය කිරීම සඳහා තීරණයන් ගත යුතු ය.
- පහත සඳහන් ක්ෂේත්‍රයන් මෙම කමිටුවේ විෂය පථයට අයත් වේ.

a. මූල්‍ය අංශයේ ප්‍රධාන වත්කම් වන ණය සම්පාදනය සහ බාහිර ආයෝජනයන්ගේ ශක්‍යතාව, ලාභදායිත්වය, අවදානම් සහ අනුකූලතාවන් විශ්ලේෂණය කිරීම. මේ අනුව ණය පොළී අනුපාත, උකස් පොළී අනුපාත, රන් පවුමකට දෙන අත්තිකාරම් පරිමාව, වෙළෙඳපලේ රන් මිල, සමිතිය විසින් ආයෝජනය කරන මුදල් සඳහා ලැබෙන ප්‍රතිලාභ සහ පොළී අනුපාත අවදානම පිළිබඳව අධ්‍යනය කිරීම.

b. සමිතියේ තැන්පතු සහ බාහිර ණය, පොළී අනුපාත පිළිබඳව තීරණයන් ගැනීම.

c. සමිතිය විසින් මිලදී ගැනීමට අපේක්ෂා කරන නිශ්චල හා චංචල දේපළ සහ ව්‍යාපාරික ගිවිසුම් ආදිය පිළිබඳව අධ්‍යනය කර තීරණයන් කිරීම.

d. දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය තුළ සිදු වන වෙනස්කම් සමිතියේ මූල්‍ය තත්ත්වය සහ තිරසාරත්වය කෙරෙහි ඇති විය හැකි බලපෑම් විශ්ලේෂණය කිරීම.

e. සමිතියේ ශේෂ පත්‍රයට සහ ආදායම් ප්‍රකාශයට සෘණාත්මක බලපෑම් ඇති කරන සියළුම සාධක, තීරණ සහ වෙනස්වීම් සඳහා නිවැරදි තොරතුරු රැස් කර අවශ්‍ය නිර්දේශයන් ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

f. මූල්‍ය සේවා සමිතියක වත්කම් හා වගකීම් කමිටුව සිය සාමාජික සහ සාමාජික නොවන තැන්පතු සහ අනෙකුත් භාහිර ණය සහ වගකීම් පියවීමට හැකියාවක් ඇති බව සහ ආයතනය ද්‍රවශීලතාව අතින් ශක්තිමත් සහ අවදානම් රහිත බව නිරන්තරයෙන් තහවුරු කර ගනිමින් කටයුතු කළ යුතු ය.

- කමිටු සාමාජිකත්වය පහත පරිදි විය යුතු ය.
  - i. සභාපති හෝ උපසභාපති
  - ii. අධ්‍යක්ෂවරයෙකු
  - iii. සාමාන්‍යාධිකාරී
  - iv. ගණකාධිකාරී
  - v. බැංකු සේවා කළමනාකරු

## 3.3 සම්බන්ධිත පාර්ශවීය ගණුදෙනු (Related party Transactions) සහ බැඳියා පිළිගැටුම් තත්ත්වයන් (Conflict of interest)

- මෙම නෛතික සංකල්පය මහජනයාගේ තැන්පත් භාර ගන්නා මූල්‍යායතනයන්ට අතිශයින් වැදගත්ය. සම්බන්ධිත පාර්ශවයන් යනු කලත්‍රයන් (Spouses), දූ දරුවන්, සමීපස්ථ ඥාතීන් සහ වෙනත් සෘජු හෝ වක්‍රව සබඳතා පවත්නා පාර්ශවයන් ය. මූල්‍ය අංශය තුළ මෙවැනි සබඳතා ඇති පාර්ශවයන් රාජකාරී කටයුතු කිරීමේ දී සහ කළමනාකරණ තීරණයන් ගැනීමේ දී බැඳියා පිළිගැටුම් තත්ත්වයන් ඇති වේ.
- මෙවැනි සබඳතා තුළින් සෙසු සේවකයන් නොසන්සුන් බවට පත් වීම, රාජකාරී කටයුතු වලදී මන්දෝත්සාහී වීම, අනභිප්‍රේරණය (Demotivation) සහ කණ්ඩායම් වල ප්‍රබෝධනය හීන

වීමෙන් ආයතනයේ ඵලදායීතාව පහත වැටෙනවා පමණක් නොව ඇතැම් බැඳියා පිළිගැටුම් තත්ත්වයන් තුළින් නෛතික ප්‍රශ්න ද පැන නගිනු ඇත.

- 2007 අංක 07 දරණ සමාගම් පනත සහ මහ බැංකුව විසින් සියළුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කර ඇති මඟපෙන්වීම් හා උපදෙස් අනුව මෙය සාවද්‍ය පරිචයකි. තවද, ඇතැම් සමිති වල මෙම තත්ත්වය තුළින් පැන නැගුණු ගැටළු හේතුවෙන් විශාල මූල්‍ය අලාභයන්ට ද හේතු කාරක වී ඇත.

  එහෙයින් සැම විටම මූල්‍ය සේවා සමිති තුළ මෙම අයහපත් තත්ත්වය ඇති නොවීමට සහ දැනට මෙවැනි තත්ත්වයන් පවතින්නේ නම් කඩිනමින් නිවැරදි කිරීමේ පියවරයන් ගත යුතු ය.

### 3.4 තොරතුරු හෙළි කිරීමේ මූලධර්මයන් (Principles of Disclosure)

- යහපත් පාලන ක්‍රමෝපායන්හිදී සැම විටම විනිවිදභාවය (Transparency) සහ පවත්නා තොරතුරු සාමාජිකයන්ට, තැන්පත්කරුවන්ට, නියාමනකරුවන්ට සහ ප්‍රජාවට විවෘත විය යුතු ය. සමුපකාර ව්‍යාපාරය රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ (Right to Information Act) හි ප්‍රතිපාදනයන් අදාල වේ.
- සමිතියේ මූල්‍ය අංශයේ තොරතුරු ක්ෂණික ව ලබා ගත හැකි ආකාරයට ගිණුම් පොත් පත් හා පොදු ලෙජරය යාවත්කාලීනව තිබීමත්, ප්‍රධාන කාර්ය සාධන දර්ශක (Key Performance Indicators) අදාල වන පාර්ශවයන්ට අපහසුවකින් තොරව දැන ගැනීමට හැකිවීමත්, තොරතුරු වල අව්‍යාජත්වයත්, තැන්පත්කරුවන්ට වැදගත් වන තොරතුරු සඟවා ගෙන සිටීමත් මූල්‍ය සේවා ආයතනයකට කෙසේවත් යෝග්‍ය නොවනු ඇත.

### 3.5 ආයතනයේ විනය නීති සංග්‍රහය (Disciplinary Procedure)

- විනය යනු කිසියම් ස්ථානයක දී අපේක්ෂිත හැසිරීම යි. (Expected Behavior) විනය අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට පහළම ශ්‍රේණියේ සේවකයා දක්වා පවත්වා ගත යුතු උත්තරීතර පරිචයක් වේ. නිර්ව්‍යාජත්වය, විවෘතභාවය, ආයතනයට අදාළව කළ යුතු සහ නොකළ යුතු රීති මාලාවන්ට අනුකූල වීම, විනයගරුක සියළුම දෙනාගේ වගකීමක් වන අතර විනය කඩ කිරීම දඬුවම් ලැබීමකට වඩා ආයතනයේ තිරසාරත්වයට, සාමාන්‍ය කටයුතු වලට බාධාවක් වේ.
- දැනට පරිහානියට පත්වූ සහ පිරිහෙමින් පවත්නා සමුපකාරික ආයතනයන් පමණක් නොව රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ඒකකයන්ද කඩා වැටීමට මූලික හේතුවක් වී ඇත්තේ විනය රීතීන් කඩවීම බව මේවා පිළිබඳව අධ්‍යනය කළ පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත.
- සැම ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගමයක්ම රජයේ ආයතන සංග්‍රහයට සහ රටේ පොදු නීතියට ගැළපෙන, සමුපකාර ප්‍රතිපත්ති වලට අනුකූල වූ විනය නීති සංග්‍රහයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, ආයතනයේ සමස්ත මානව සම්පත වෙත සන්නිවේදනය කර ක්‍රියාත්මක කළ යුතු ය.

**3.6 ආයතනයේ සමස්ත සේවක පිරිසගේ ආචාර ධර්ම පද්ධතිය (Code of Conduct)**

- ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට පහළ සේවකයා වෙත අදාළ වන ආචාර ධර්ම පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය. මෙම ප්‍රඥප්තිය තුළින් ආයතනයෙන් බාහිර පාර්ශවයන් වෙත ඉටු විය යුතු යුතුකම්, සදාචාරාත්මක පරිචයන්, උසස් චර්යාධර්ම ඇතුළත් විය යුතු අතර, ගණුදෙනුකාර ප්‍රජාවගෙන් ආයතනයට ඉටු විය යුතු යුතුකම් සහ වගකීම් ද නිරූපණය විය යුතු ය. මෙය සකස් කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ගණුදෙනුකාර ප්‍රඥප්තියේ (Customer Charter) සඳහන් වැදගත් උපදෙස් සහ මගපෙන්වීම් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

**04. විශේෂ කරුණු**

- මූල්‍ය සේවා අංශයේ ඇතැම් සමිති/ සංගම්වල මෙම චක්‍රලේඛයේ සඳහන් අදහස් සහ මඟපෙන්වීම් මේ දක්වා ක්‍රියාත්මක නොකරමින් තිබිය හැකි අතර ඇතැම් සමිතිවල ක්‍රියාත්මක කරමින් තිබිය හැක.
- මෙම උපදෙස් සහ යෝජනා ඔබ සමිතිවල සමස්ත සේවක මණ්ඩලය දැනුවත් කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කිරීමටත් පියවර ගැනීම සුදුසුය.
- වර්තමානයේ දී මූල්‍ය සේවා සමිති විසින් මුහුණ දී ඇති ද්‍රවශීලතා ගැටළු, ප්‍රදානිත ණය මුදල් අය නොවීම, ආයෝජන කළඹ නිසි ලෙස කළමනාකරණය නොකිරීම සහ වෙනත් දුර්වලතා වලට එක්තරා දුරකට මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රතිකර්මයන් ලෙස සැළකිය හැක.

**05. සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය, බලතල සහ වගකීම්**

- සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල සියලුම ව්‍යාපාර කටයුතු කළමනාකරණය සඳහා අවශ්‍ය කරන මෙහෙයවීම, අධීක්ෂණය, සුපරීක්ෂණය සහ ආවේක්ෂණය පිළිබඳව කටයුතු කිරීම.
- අධ්‍යක්ෂක මණ්ඩලය සැමවිටම කටයුතු කළ යුත්තේ රටේ පොදු නීතියට, සමුපකාර නීතියට, දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට සහ පළාත් කොමසාරිස්වරුන්ගේ චක්‍රලේඛ සහ නියාමන උපදෙස්වලට අනුකූලව ය.

ඔබ සමුපකාර සමිතියෙහි/ සංගමයෙහි යහපත් වූ පාලනයන් සහ විශිෂ්ඨ ව්‍යාපාරික පරිචයන් වැඩි දියුණු කර ගැනීම සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් නියමයන්ට අනුව කටයුතු කරන මෙන් අවධාරණය කරමි.

සුචින්ද එස්. සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්